# පුස්තකාල විද්‍යා

උපදේශක සංස්කාරක

මහාචාර්ය පියදාස රණසිංහ මහතා
මහාචාර්ය ඩබ්. ඒ. වීරසූරිය මහතා
මහාචාර්ය ඩබ්. කේ. එම්. කේ. වීරසිංහ මහතා
කථිකාචාර්ය ලැගුම්දෙනියේ පියරතන හිමි
කථිකාචාර්ය ප්‍රියංවදා වනිගසූරිය මිය.

සංස්කාරක

ඩී. ජී. පුෂ්ලේකා පද්මිණී විමලසිරි

සහාය සංස්කාරක

එම්. ඒ. ධනුෂි චන්ද්‍රිමා ජයලත්
ජේ. ඒ. නදීශානි ඉමල්කා
ඒ. එම්. එස්. එස්. අබේසිංහ
ඩී. බී. ඒ. තාරක දිසානායක
ආර්. ඩී. එස්. ඩී. ඩබ්. රත්දෙණිය

ප්‍රකාශනය

පුස්තකාල හා විද්‍යාපන විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
2011

06

# සංඛ්‍යාංක පුස්තකාල : සංඛ්‍යාංක ස්වරූපයේ පුස්තකාලයන්හි ස්වභාවය, ඉතිහාසය හා වර්ධනය

ජී. පී. උදයංගනී ද සිල්වා
සහකාර පුස්තකාලයාධිපති
කැලණිය විශ්වවිද්‍යාලය

---

## සංක්ෂේපය

දත්ත ගබඩා සහ තොරතුරු සම්ප්‍රේෂණයේ ස්වභාවය අනුව බලන කළ භෞතික ද්‍රව්‍ය සංඛ්‍යාංක වූ දත්ත ගබඩාවක් ලෙස සංඛ්‍යාංක පුස්තකාල(Digital Library) හඳුනා ගත හැකිය. Hypertext තාක්ෂණය භාවිතයෙන් නිර්මිත තොරතුරු සොයන ස්වභාවයන් සංඛ්‍යාංක පුස්තකාල තුළ දක්නට ලැබේ. එසේ ම ලෝක ව්‍යාප්ත ජාලය (World Wide Web-WWW) තුළ ක්‍රියාත්මක වන ප්‍රයෝජනවත් වෙබ්අඩවි ලෙස සංඛ්‍යාංක පුස්තකාල දැකගත හැක. එසේ ම පුස්තකාල විද්‍යාවට අනුව පුස්තකාල ස්වයංක්‍රියකරණයේ ඉදිරි පියවරක් ලෙස සංඛ්‍යාංක පුස්තකාල හඳුනා ගත හැකිය. මෙලෙස හඳුනාගනු ලැබූ පුස්තකාලයන්හි අරමුණු, පරමාර්ථ, වැදගත්කම හා වාසි ප්‍රයෝජන පිළිබඳ විධිමත් අධ්‍යයනයක යෙදීම මෙම ලිපියේ අරමුණ වේ.

## සංඛ්‍යාංක පුස්තකාල

වර්තමානයේ අප ජීවත් වනුයේ තොරතුරු මූලික සමාජයකය. එකී තොරතුරු සමාජය තුළ මූලික වූ ම පාඨකයා තොරතුරු පිපාසාවෙන් පෙළෙන අතර එකී තොරතුරු අවශ්‍යතා සම්පූර්ණය කිරීම පුස්තකාලයන්හි මූලික පරමාර්ථය වන්නේය. අද දිනය වන විට සම්ප්‍රදායික පුස්තකාල එකී කාර්ය භාරය ඉටු කරන බව පෙනේ. නමුත් එහි දී සේවාවේ කාර්යක්ෂම භාවය පිළිබඳ තෘප්තිමත් වීමට අපහසුය. මේ නිසා නවීන තාක්ෂණයන් සමඟ ම පුස්තකාල